{සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித்திணைக்களம்- வடமத்திய மாகாணம்
Department of Education – North Central Province

ශ්‍රේණිය - 11 | දෙවන වාර පරීක්ෂණය - 2025 | කාලය :

විෂයය :- බුද්ධ ධර්මය

පාසලේ නම :-

ඇතුළත්වීමේ අංකය :-

# පිළිතුරු පත්‍රය

## 1 කොටස

| | | | |
|---|---|---|---|
| 01 - 2 | 02 - 4 | 03 - 1 | 04 - 4 |
| 05 - 3 | 06 - 2 | 07 - 1 | 08 - 4 |
| 09 - 3 | 10 - 2 | 11 - 1 | 12 - 1 |
| 13 - 4 | 14 - 3 | 15 - 2 | 16 - 3 |
| 17 - 1 | 18 - 4 | 19 - 2 | 20 - 3 |
| 21 - 1 | 22 - 4 | 23 - 2 | 24 - 3 |
| 25 - 4 | 26 - 4 | 27 - 1 | 28 - 2 |
| 29 - 4 | 30 - 1 | 31 - 4 | 32 - 3 |
| 33 - 3 | 34 - 2 | 35 - 1 | 36 - 4 |
| 37 - 3 | 38 - 2 | 39 - 1 | 40 - 1 |

## 02 කොටස

i. මහල්ලෙක්, ලෙඩෙක්, මළකඳක්, පැවිදි රුවක්

ii. රහසින් පව් නොකළ නිසා / ආමිෂ ප්‍රතිපත්ති පූජාවන්ට සුදුසු වූ නිසා / සියලු කෙලෙස් දුරු කළ නිසා

iii. රජගහ නුවර සීත වනයේ දී

iv. භුත්තවමිතක

v. ශාරීරික චෛත්‍යය ( ස්ථූපය), පාරිභෝගික චෛත්‍යය ( බෝධිය ), උද්දේසික චෛත්‍යය ( බුදු පිළිමය)

vi. අනුරාධපුරයේ බිසෝ මාලිගය අසල සඳකඩපහණ

vii. තණ්හාව, මානය, මිත්‍යා දෘෂ්ටිය... මෙයින් දෙකක්

viii. නිරෝගී බව, නිවැරදි බව, දක්ෂ බව .. මෙයින් දෙකක්

ix. සිගාලෝවාද සූත්‍රය

x. ඊශ්වරයාගේ කැමැත්ත අනුව සියල්ල සිදුවේ යන මතය ( ඊශ්වර නිර්මාණවාදය ) සියල්ල පෙර කර්මය අනුව සිදු වේ යන මතය ( සබ්බං පුබ්බේකත හේතුවාදය) සියල්ල අහේතුකව ඉබේම සිදුවේ යන මතය (අහේතු අප්පච්චය වාදය )

2. i. සප්ත සමාපත්තිලාභී - ආලාර කාලාම තවුසා

අෂ්ට සමාපත්තිලාභී - උද්දකරාම පුත්ත තවුසා

ii. කල්‍යාණමිතුරු ඇසුර/ සිල්වත් වීම/ ධර්ම ශ්‍රවණය/ වීර්යය/ ප්‍රඥාව... මෙයින් තුනක්

iii. ධාරණ ශක්තිය වැඩි වේ.පොත පාඩම් කිරීමේ දී වෙනදාට වඩා පහසුවක් ඇති වේ. සිතේ තෘප්තිමත් භාවය ඇති වේ.සිත විසිරී යාමට නොදී එකඟ සිතක් ඇති කර ගැනීමට උපකාරී වේ. මතක ශක්තිය ඇති වේ.යමක් වහා අවබෝධ කර ගැනීමේ ශක්තිය දියුණු වේ. පිළිවෙලකට යමක් සිදු කිරීමට හැකි වේ. නිවැරදිව නිරවුල්ව පිළිතුරු ගොනු කිරීමට හැකි වේ. ජය පරාජය සමව දරා ගැනීමට හැකි වේ. ඕනෑම අභියෝගයකට මුහුණ දීමේ හැකියාව ශක්තිය වර්ධනය වේ. මේ ආදී කරුණු වලින් කිහිපයක් ඇතුළත් කර පිළිතුර ලියා තිබිය යුතුවේ. සමස්ත පිළිතුර බලා ලකුණු ප්‍රදානය කරන්න.

3. i. චේතනාහං භික්ඛවේ කම්මං වදාමි, චේතයිත්වා කම්මං කරෝති කායේන වාචාය මනසා ( මහණෙනි මම චේතනාව කර්මය යැයි කියමි. චේතනාව සිත කය වචනයෙන් ක්‍රියාත්මක කරයි.)...මෙම හැඳින්වීම පාලියෙන් හෝ සිංහලෙන් වේ නම් ලකුණු ලබා දෙන්න.( කර්මය යනු ක්‍රියාව...යන හැඳින්වීම පමණක් තිබේ නම් ලකුණු ලබා නොදෙන්න.)

ii. අභිධ්‍යාව - දැඩි ලෝභය/ මසුරු බව

ව්‍යාපාදය - තරහව

මිච්ඡා දිට්ඨිය - මිත්‍යා දෘෂ්ටිය/ වැරදි දැකීම/ වැරදි වැටහීම

iii. ගති සම්පත්ති, උපධි සම්පත්ති, කාල සම්පත්ති, ප්‍රයෝග සම්පත්ති සතර හා ගති විපත්ති, උපධි විපත්ති, කාල විපත්ති, ප්‍රයෝග විපත්ති යන කරුණු ඇසුරු කරමින් ඒවායෙහි අර්ථ මතු කර දක්වමින් මෙම පිළිතුර ලියා තිබිය යුතුයි.සමස්ත පිළිතුරු බලා ලකුණු ලබා දෙන්න. ( මේ සඳහා 10 ශ්‍රේණියේ පෙළ පොතේ 71,72 පිටු පරිශීලනය කරන්න)

4. i. සුකරානි අසාධූනි

අත්තනෝ අහිතානි ච

යං වේ හිතං ච සාධුං ච

තං මේ පරං දුක්කරං

ii. තමාට අහිත වූ අහපත් දේ කිරීම ඉතා පහසුය. යම් දෙයක් තමාට වැඩදායක ද යහපත පිණිස හෝ පවතී ද එවැනි දේ කිරීම ඉතා අපහසුය. මෙම අර්ථයම හෝ මෙම අර්ථය මතු කරන අයුරින් ලියූ පිළිතුරකට ලකුණු දෙන්න.

iii. බෞද්ධයාගේ අත්පොත ධම්මපදය වන අතර උපතේ සිට මරණය තෙක්ම ජීවිතයකට ලබා දෙන උපදෙස් මෙහි ඇතුළත් වේ. ඕනෑම ගැටලුවකට ප්‍රශ්නයකට විසඳුමක් හා පිළිතුරක් මෙන්ම පීඩනයන්ගෙන් මිදීමට උපදෙස් ද ධම්ම පද ගාථා තුළින් මතු කර ගත හැකිය. සිසුන්ට නිර්දේශ කර ඇති ධම්මපද ගාථා 09 තුළින් ලබා දෙන උපදේශයන්ගෙන් අවම ගාථා 03 ක උපදෙස් ඇතුළත් කරමින් මෙම පිළිතුර ලියා තිබිය යුතුයි. පාලි ගාථාව අනිවාර්ය නොවන නමුත් ගාථාවේ අර්ථය එමගින් මතු කරන උපදෙස් නිරවුල්ව පිළිතුර තුළ තිබිය යුතුය.සමස්ත පිළිතුර බලා ලකුණු දෙන්න. ( 11 ශ්‍රේණිය පෙළ පොතේ 49 - 54 පිටු පරිශීලය කරන්න.)

5. i. උපත - ලුම්බිණි සල් උයනේ

වප් මඟුල් දින ආනාපානසති භාවනාව වැඩීම දඹරුක් සෙවනේ

දේවදත්ත කුමරු හීයෙන් හංසයාට විදි අවස්ථාවේ හංසයාව බේරා ගත්තේ වනය තුළදී ය.

බොහෝ කුමාරවරු වනයට ගිය විට සත්ව හිංසනය සිදු කරන නිසා ඡන්න ඇමති සමග පමණක්

උයනට ගිය අවස්ථාව

ශිල්ප දැක්වීම - මඟුල් උයනේ

අභිනිෂ්ක්‍රමණය කිරීමෙන් පසුව සිටියේ - උරුවෙල් දනව්වේ.

දුෂ්කර ක්‍රියා සිදුකළේ - වනය තුළ දී ය.

ii. 10 ශ්‍රේණියේ පෙළ පොතේ 90 පිටුවේ යට කොටසේ හා 91 පිටුවේ උඩ කොටසේ ඇති අවස්ථාවන්ගෙන් 03 ක් නම් කර තිබිය යුතු ය.

iii . පරිසර සංරක්ෂණය ගැන බුදු දහම සුවිශේෂිව කරුණු දක්වයි. තුරුලතා, වාතය, ජලය ඇතුළුව සමස්ත පරිසර පද්ධතියම ආරක්ෂා කර ගත යුතු අයුරු පෙන්වා දී ඇත. ඒ පිළිබඳව කරුණු රැසක් 10 ශ්‍රේණියේ පෙළ පොතේ 92 පිටුවේ, 11 ශ්‍රේණියේ පෙළ පොතේ 100 වැනි පිටුවේත් දක්වා ඇත.එම කරුණු වලින් තුනක්වත් ඇතුළත් කරමින් ලියූ පිළිතුරේ සමස්තය සලකා බලා ලකුණු ලබා දෙන්න.

6. i. 11 ශ්‍රේණියේ පෙළ පොතේ 65,66 පිටු වල සඳහන් මංගල කරුණු වලින් 02 ක් ද, 66,67 පිටුවල සඳහන් පරාභව කරුණු වලින් 02 ක් ද ලියා තිබිය යුතු යි.

ii. 11 ශ්‍රේණියේ පෙළ පොතේ 70 පිටුවේ උඩ සඳහන් කරුණු 10න් 03ක් ලියා තිබිය යුතු යි.

iii. චක්කවත්තී සීහනාද සූත්‍රයට අනුව සමාජ ප්‍රශ්න හේතුඵලවාදීව සිදුවන අයුරු පෙන්වා දී ඇත.ධනය නැති නිසා දුප්පත්කමත්, දුප්පත්කම නිසා සොරකමත්, සොරකම නිසා අවිආයුධ බහුල වීමත්, අවිආයුධ බහුල වීම නිසා ප්‍රාණඝාතයත්, ප්‍රාණඝාතය නිසා බොරුව, කේලම ඇතිවීමත්, බොරුව, කේලම නිසා අනිසිකාම සේවනය ඇති වීමත්, අනිසිකාම සේවනය නිසා රළු වචන, හිස්වචන ඇති වීමත්, රළු වචන, හිස්වචන නිසා මිත්‍යාදෘෂ්ටිය ඇතිවීමත්, මිත්‍යාදෘෂ්ටිය නිසා අධර්මයේ ඇලීම, විසම ලෝභය, මිත්‍යාධර්ම ඇතිවීමත්, එම කරුණු නිසා මවුපියන්ට ගරු නොකරන, පැවිද්දන්ට නොසලකන, කුල දෙටුවන් නොපුදන අධාර්මික සමාජයක් ඇති වේ...මෙම කරුණු හේතු ඵලවාදීව විස්තර කරමින් පිළිතුරු ලියා තිබිය යුතුයි. සමස්ත පිළිතුර බලා ලකුණු දෙන්න.

7. i. පංචනීවරණ ධර්ම

නිවනට බාධාකරන, නිවන අහුරාදමන ක්ලේශ ධර්ම නීවරණ වේ. ඒවා ගණනින් 05 කි. සමථ භාවනාවේ දී මේවා යටපත් වේ. විපස්සනා භාවනාවේ දී මේවා නැති වේ. පංච නීවරණ සඳහා ජල උපමා 05 කි. ඒවා නම්,

කාමච්ඡන්දය - පංච කාමයට ඇති ආශාව - වර්ණ ගැන් වූ ජලය/ ව්‍යාපාද - තරහව - බුබුලු දමන රත් වූ ජලය/ ථීන මිද්ධ - සිත කයෙහි උදාසීන බව - පාසි සහිත ජලය/ උද්ධච්ච කුක්කුච්ච - සිතෙහි නොසන්සුන්කම - කැළඹුණු ජලය/ විචිකිච්ඡාව - සිතෙහි සැකය - බොර වූ ජලය..

එසේම සාමඤ්ඤඵල සූත්‍රයේ දී මේවායින් 04 කට තවත් උපමා දක්වා ඇත. ඒවා නම් කාමච්ඡන්දය - ණය ගැතියෙකු ණය හිමියාට ඇති බැදීම/ ව්‍යාපාද - පිත් රෝගයෙන් පෙළෙන්නෙකුට/ උද්ධච්ච කුක්කුච්ච - සිරගෙයක දුක් විදින්නෙකුට/ විචිකිච්ඡා - වනයෙහි අතරමංවූවෙකුට...මේ ආදී කරුණු අතරින් ප්‍රමාණවත්ව ලියූ පිළිතුරකට ලකුණු දෙන්න.

ii. ත්‍රිලක්ෂණය

බුදු දහමේ මූලික ඉගැන්වීමකි.අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ලෙස ත්‍රිලක්ෂණය නම් කළ හැකියි. විශ්ව සාධාරණය ඉගැන්වීමක් වන මෙය දේශ, කාල වශයෙන් වෙනස් නොවේ. ප්‍රඥාව අවබෝධ කර ගත්තා යැයි සඳහන් වන්නේ මෙම ත්‍රිලක්ෂණය අවබෝධය ලබා ගත් විටයි.

අනිත්‍ය යනු වෙනස් වීමයි. කැඩෙන බිදෙන සුලු බවයි. මෙම කැඩෙන බිදෙන බව බුදු දහමේ ලෝක ලෙස ව්‍යවහාර වේ.ලොව සියල්ල මොහොතින් මොහොත වෙනස් වන බව ඉන් අදහස් වේ. සත්ව පුද්ගල ද්‍රව්‍ය ආදී ඕනෑම ජීව අජීව පදාර්ථයකටම මෙම තත්වය පොදු ධර්මතාවයකි. ඒ අනුව රූපය - පෙණ පිඬක් වැනිය. වේදනාව දිය බුබුලක් වැනි ය.සඤ්ඤාව මිරිඟුවක් වැනිය. සංස්කාර කෙසෙල් කඳක් වැනිය. විඤ්ඤාණය මායාවක් වැනි ය. මෙම පංචස්කන්ධය අනිත්‍ය ලක්ෂණයෙන් යුත් බව එම උපමා තුළින්ම පැහැදිලි වේ.

දුක්ඛ යනු දුක් සහිත බවයි.මෙහි දී දුක යනුවෙන් හැදින්වෙන්නේ සරල සාමාන්‍ය අප්‍රසන්න දුක නොවේ.එය ජීවිතයේ යථාර්ථය යි. දම්සක් පැවතුම් සූත්‍රයේ දී දුක් වර්ග 08 ක් දක්වා ඇත.ලොව දුක මත පිහිටා ඇත. මෙම දුක ලොව පවතින තවත් ලක්ෂණයකි. අනාත්ම යනු අනිත්‍ය දුක්ඛ ලක්ෂණය ඇති ලෝකය තුළ මමය මාගේය ලෙසින් ගත නොහැකි බව හගවන ලක්ෂණය යි...10 ශ්‍රේණිය පෙළ පොතේ 74-76 පිටු වල අන්තර්ගත කරුණුත් ඇතුළත් කළ පිළිතුරකට ලකුණු දෙන්න.

iii. සතර අගතිය

බෞද්ධ පාලන ධර්ම ප්‍රතිපත්ති අතරින් එකක් සතර අගතිය හඳුනාගත හැකිය.යහපත් රටක් ඇති කිරීම පිණිස පාලනය ගෙන යන පාලකයෙකු ඡන්ද, ද්වේෂ, භය, මෝහ යන මෙම සතර අගතියෙන් තොර විය යුතු බව බුදු දහමේ ඉගැන්වීමයි,මෙම සතර අගතියෙන් තොර පාලකයා පුර පක්ෂයේ සඳ මෙන් බබලන බවත් මෙම සතර අගතියෙන් යුතු පාලකයා අමාවක සඳ මෙන් පිරිහෙන බවත් දක්වා ඇත.

ඡන්දය යනු කැමැත්තයි. මෙහි අගතිගාමී වීම යනු තමන්ගේකම, නෑදෑකම, හිතවත්කම, පක්ෂපාතීත්වය අනුව අයුතු වැඩ කිරීමයි.ද්වේශය යනු විරුද්ධවාදී සිතුවිල්ලකි.තම මතයට ප්‍රතිවිරුද්ධයන්ට පාලකයා කටයුතු කරන්නේ ද්වේෂ සහගතවය. එනම් තරහ ඇතිවය. පාලකයා තුළ පවතින බිය තත්වය නිසාම ඔහුට රටක් පාලනය කිරීමට නොහැකිය.ජනතාවගේ ආරක්ෂකයා විය යුත්තේ පාලකයා ය.ඔහු වීරත්වය පෞරුෂත්වය ඉහළින් තබා ගත යුතුයි. මෝහය යනු මුලාවට පත්වීමයි. රටවැසියාට යුක්තිය සාධාරණත්වය ඉටු කිරීම උදෙසා පාලකයා බුද්ධිමත් විචක්ෂන ශීලී අයෙකු වීම අනිවාර්ය කරුණකි...මේ ආදී කරුණු ඇතුළත් පිළිතුරකට ලකුණු ලබා දෙන්න.( 10 ශ්‍රේණිය පෙළ පොතේ 129 පිටුව බලන්න)

iv. ප්‍රඥා පාරමිතාව

පාරමිතා ධර්ම 10කි. බුදුකුරු ධර්මවල 04 වැනි පාරමිතාව ප්‍රඥා පාරමිතාවයි. ජීවිතය හා ලෝකය පිළිබඳව ඇති තතු හෙවත් යථාතත්වය වටහා ගැනීම ප්‍රඥාවයි. බෝසත්වරු ප්‍රඥා පාරමී, ප්‍රඥා උපපාරමී, ප්‍රඥා පරමත්ථ පාරමී ලෙසින් ත්‍රිවිධාකාරයෙන් පඥා පාරමිතාව පූරණය කරති.ප්‍රඥාව ලබා ගන්නා ක්‍රම තුනකි. චින්තාමය ප්‍රඥා - සිතීමෙන් නුවණ දියුණු කිරීම/සුතමය ප්‍රඥා - සවන් දීමෙන් හා පොතපතින් ලැබෙන නුවණ/ භාවනාමය ප්‍රඥා - භාවනාවෙන් නුවණ දියුණු කිරීම වේ. තණ්හාව මානය මිත්‍යාදෘෂ්ටියෙන් මිදී කරුණාවෙන් යුතුව ප්‍රඥාව දියුණු කර ගත යුතුය. බෝසතාණන් වහන්සේ ප්‍රඥා පාරමිතාව පූරණය කළ ආකාරය උම්මග්ග ජාතක කතාවෙන් හෙළි වේ. ප්‍රඥා පාරමිතාව

වනාහි නූතන සමාජයේදී ද සෑම පුද්ගලයෙකුටම අනිවාර්යයෙන් පූරණය කළ යුතු ප්‍රායෝගික පාරමිතා ධර්මයක් ලෙස හඳුනාගත හැකිය...මේ ආදී කරුණු ඇතුළත් පිළිතුරකට ලකුණු ලබා දෙන්න.( 11 ශ්‍රේණිය පෙළ පොතේ 24 පිටුව බලන්න)